# 2019 වසර සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

# අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මුල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

# පරිච්ඡේදය - 01

# 1.ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාතර්මේන්තුව

### හැඳින්වීම

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ක්‍රිස්තියානි
ධර්මයේ සහ සංස්කෘතියෙහි පැවැත්ම හා වර්ධනය සදහා
රජයේ ප්‍රතිපත්තිය
අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### දැක්ම

ක්‍රිස්තියානි ජනතාවගේ සුභසිද්ධිය සදහා ක්‍රියාකිරීම

### මෙහෙවර

ක්‍රිස්තියානි ධර්මයේ සහ සංස්කෘතියෙහි වටිනාකම්
හා විශ්වාසයන් සමාජයේ පිළිගත් ආකාරයට ප්‍රවර්ධනය කිරීම

### අරමුණ

සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සදහා ආගමික වටිනාකම්
ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති සහ වැඩසටහන්
සම්පාදනය කිරීම හා අධීක්ෂණය.

# ප්‍රධාන ක්‍රියාකාරකම්

1. වන්දනාගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවධර්න කාර්යයන් සිදුකිරීම.
2. ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.
3. සංවධර්න සහයයන්
4. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවධර්න හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.
5. කිතුණු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරුසේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
6. කිතුණු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවධර්නය කිරීම.
7. බයිබලීය දැනුම වධර්නය කිරීම උදෙසා බයිබල් දැනුම මිනුම තරගය පැවැත්වීම.
8. කිතුණු ජනතාවගේ අති උතුම් මංගල්‍ය වූ පාස්කු මංගල්‍යට අදාල වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
9. කිතුණු ජනතාවගේ ගෞරවාදරයට පත් උතුම් මංගල්‍ය වූ නත්තල් උත්සවය සඳහා දායකත්වය ලබාදීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම.
10. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරීම.
11. කිතුණු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවධර්නය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවධර්නය කිරීම.
13. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාශර්ව වෙත වීසා නිර්දේශ ලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
14. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
15. කිතුණු දේශීය පැවිදි පාශර්ව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
16. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාතර්මේන්තුව මගින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘතීන්
17. කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

# ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ වෙසෙන කිතුනු ජනතාව සියවස් ගණනක් මුළුල්ලේ ස්වකීය ආගමික මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධ වෙමින් සිය ආගමික පූජාවන් පවත්වන ලද නමුත් එකී ආගමික සංවිධාන හා රජය අතර ඍජු ක්‍රමික සබඳතාවක් ගොඩනැගී නොමැත. එසේ නමුත් හැමවිටම සෑම රජයක් යටතේම සිය ආගම් ඇදහීමේ නිදහස ඔවුනට හිමිවිය.

පසුගිය දශකයක පමණ කාලය තුළ **සියලුම ආගම් වලට සමානව සැළකිය යුතුය** යන සංකල්පය යටතේ කිතුනු ජනතාව හා ඔවුන්ගේ වන්දනාවට පාත්‍රවූ ආගමික සිද්ධස්ථාන කෙරෙහි රජයක් වශයෙන් ඉටුකළ හැකි මෙහෙය ඉතා පුළුල්වෙමින් වර්ධනය වූ අතර කිතු බැතිමතුන් හා පූජ්‍ය පක්ෂය කෙරෙහි රජයේ අවධානය වැඩිවශයෙන් යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කිතුනු ආගමික සංස්ථාව තුළත් ආගමික මධ්‍යස්ථාන හා රජය අතරත්අන්නෝන්‍ය විශ්වාසය හා සම්බන්ධතාවය ක්‍රමවත් ලෙස වර්ධනය විය.

කිතුනු ආගමික වත්පිළිවෙත් ඉටුකරණු වස් පුදපූජා පවත්වමින් ආගමික ඇවතුම් පැවතුම් ගුණ ධර්ම වර්ධනය කිරීමේ මූලික අඩිතාලම ගොඩනගනුයේ ගම්වල හා නගරවල පිහිටි ආගමික සිද්ධස්ථාන මඟිනි. රෝමානු කතෝලික සභාව හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට අනුබද්ධ ක්‍රිස්තියානි සභාවන්ගේ එකමුතුව ඇතිව එකී සිද්ධස්ථාන මූලික කරගෙන අධ්‍යාත්මික හා ආකල්පමය වශයෙන් කිතුනු ජනතාව සංවර්ධනය කිරීමටත්, සදාචාර සම්පන්න දූදරුවන් අනාගතයට දායාද කිරීමටත් අවශ්‍ය අනුග්‍රහය රජය හා අනෙකුත් ආයතන මඟින් ලබාදීමත් අපගේ සේවාවයි.

1999 වෂර්යේ මැයි මසදි කැබිනට් පත්‍රිකාවක් මඟින් සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රිස්තියානි ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ලෙස ඇරඹි මෙම දෙපාර්තමේන්තුව පසු වසර කිහිපය තුළ විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් විවිධ අමාත්‍යාංශ මෙන්ම අමාත්‍යවරු යටතේ ක්‍රමිකව විකාශනය වන්නට විය. 2007ක් වූ අගෝස්තු මස 01 වන දින සිට වඩාත් සක්‍රිය දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වඩාත් සංවිධිත හා ක්‍රමවත්ව වර්ධනය වූ අතර එකී කාර්යභාරය අංශ හතරක් යටතේ ක්‍රියාත්මක වන්නට විය. ඒවා නම්,

- **පාලන අංශය**
- **සංවර්ධන අංශය**
- **ගිණුම් අංශය**
- **අභ්‍යන්තර විගණන අංශය**

## ❖ පාලන අංශය

දෙපාර්තමේන්තුවේ ආයතනික, පරිපාලන හා කළමනාකරණ කටයුතු මෙහෙයවමින්, අරමුණු ඉටුකිරීමෙහිලා සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සිදුකිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබන කාර්යයයි.එම කාර්යය පහත පරිදි වේ.

1. කාර්ය මණ්ඩලයේ සියලු නිළධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු වලට අදාලව සියලු ආයතනික කටයුතු පවත්වාගෙන යාම.
2. පුරප්පාඩු සඳහා නවක නිළධාරින් බඳවා ගැනීමට අදාලව කටයුතු හා බඳවාගැනීමේ පටිපාටි ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
3. යම් යම් අවස්ථාවලදී ඉල්ලනු ලබන පරිදි ආයතනික තොරතුරු හා වාර්තාවන් ලබාදීම.
4. නිළධාරින්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් වලට අදාළ රාජකාරි කටයුතු.
5. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, දෙපාතර්මේන්තු චක්‍රලේඛ සහ අනෙකුත් සියලු චක්‍රලේඛ යාවත්කලීනව පවත්වාගෙන යාම.
6. ආයතනයේ දුරකතන, විදුලිය, ජලය, ගොඩනැගිලි හා අනෙකුත් විවිධ වියදම් සම්බන්ධව බිල්පත් නිරවුල් කිරීමට ඉදිරිපත් කිරිම හා නඩත්තු කිරීමේ කටයුතු කිරීම.
7. ආරක්ෂක සේවා සැපයීම,පවිත්‍ර කිරීමේ සේවා සැපයීම, පරිගනක යන්ත්‍ර සේවා කිරීමේ කටයුතුඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම, ෆැක්ස් යන්ත්‍ර හා අනෙකුත් ගිවිසුම්ගත සේවා කටයුතු වලට අදාල සියලු රාජකාරි කිරිම.
8. දෛනික පැමිණීමේ විස්තර යාවත්කාලීනව පවත්වාගෙනයාම, රාජකාරි නිවාඩු, දුම්රිය බලපත්‍ර නිකුත් කිරිම, නිරවුල් කිරිම හා දුම්රිය ප්‍රවේශපත්‍ර ගොනුව නඩත්තු කිරිම.
9. අග්‍රහාර විෂයට අදාලව සියලු රාජකාරි කටයුතු.
10. ණය අයදුම්පත් ලබාගැනීම හා ඒවා සම්පූර්ණ කර ගිණුම් ශාඛාවට ඉදිරිපත් කිරීම.
11. වාහන නඩත්තුව හා ප්‍රවාහනයට අදාලව සියලුම රාජකාරී.
12. ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශ ලබා දීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
13. ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
14. කිතුණු දේශීය පැවිදි පාශර්ව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරිම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
15. කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
16. තොරතුරු දැනගැනීමේ පණතේ විධිවිධාන යටතේ බාහිර පාශර්වයන් වෙත තොරතුරු ලබා දීම.

## ❖ සංවර්ධන අංශය

දෙපාර්තමේන්තුව සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන හා වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් යොදවාගෙන දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කෙරෙන අන්දමේ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම. ලැබෙන අරමුදල් යොදවා කරනු ලබන ව්‍යාපෘති ආගමික හා සාමාජික වශයෙන් දියුණුවක් ඇති කිරීම සඳහා දේවස්ථාන කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු සංවිධානය හා සමායෝජනය කිරිම. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලට අවශ්‍ය අරමුදල් ලබාදීම හා ප්‍රගතිය මැන බැලීම.

**ඉහත කාර්යභාරය සංවර්ධන අංශය මඟින් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.**

01. වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හී සංවර්ධන කාර්යයන් සිදුකිරිම.
02. ප්‍රසිද්ධ සිද්ධස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම.
03. ආර්ථික වශයෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති වසර සියයකට වඩා පැරණි දේවස්ථාන ප්‍රතිසංස්කරණය කිරිම සඳහා ආධාර ලබාදීම.
04. ආර්ථික සහය අවශ්‍ය කිතුණු දේවස්ථානවල සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර කිරීම.
05. ආර්ථික සහය අවශ්‍ය කිතුණු ආගමික ආයතන සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර කිරීම.
06. කිතුනු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම
07. දහම් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම
08. දහම් ගුරුවරුන් සඳහා දීමනා ලබා දීම
09. කිතුනු ආගමික සාහිත්‍ය, කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරිම.
10. කිතුණු කලා කරුවන් ඇගයීම
11. කිතුණු කතුවරුන්ගේ ප්‍රකාශ මිල දී ගැනීම හා දහම් පාසල් පුස්තකාල සඳහා පොත් ලබා දීම
12. කිතුනු ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ නත්තල් උත්සව සඳහා දායකත්වය ලබාදීම.
13. නත්තල් තැපැල් මුද්දර නිකුත් කිරීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම
14. කිතුනු ජනතාවගේ වන්දනාවට පාත්‍ර වූ පාස්කු වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම
15. ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරිම.
16. කිතුනු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවධර්නය අරමුණු කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# ❖ ගිණුම් අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ හා ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ ආයතන අංශය හා සංවර්ධන අංශය මඟින් ඉටුකරනු ලබන සියලුම කාර්යභාරයන්ගේ අවසන් ක්‍රියාවලිය වන මූල්‍යමය වගකීම නිසියාකාරව මෙහෙයවීම හා නිවැරදිව ඉටුකරනු ලැබීම මෙහි කාර්යභාරය වෙයි.

එම කාර්ය පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලබයි.

01. සියලුම ගෙවීම් කටයුතු සම්බන්ධව වවුචර්පත් භාරගෙන ඒවායේ ගණිතමය නිරවද්‍යතාවය තහවුරුකොට වවුචරයට අදාලව හා ප්‍රමානවත් පරිදි ප්‍රභව ලියවිලි ඇත්ද යන්න පරීක්ෂා කර, මුදල් රෙගුලාසි හා විවිධ මුදල් සීමාවන් තුළ ගෙවීම් සඳහා නිසි අධිකාරි බලය ලැබී ඇත්ද යන්න තහවුරු කොට වියදම සහතික කිරිම සඳහා ඉදිරිපත් කිරිම.

02. සහතික කරන ලද වවුචර්පත් මුදල් පොතට ඇතුලත් කොට නිවැරදි පරිදි ගෙවීම් කටයුතු කිරීම සඳහා මුදල් පොත නඩත්තු කිරීම හා චෙක්පත් ලිවීම.

03. වැටුප් සැකසීමේ කටයුතු කිරිම හා වැටුප් අවකරණ ලේඛන නඩත්තු කිරිම.

04. වාර්ෂික විසර්ජන ගිණුමට අදාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි සකස් කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු සැකසීම.

05. සුළු මුදල් අත්තිකාරම් පවත්වාගෙන යාම හා සුළු මුදල් පොත නඩත්තු කිරිම , බැංකු ගනුදෙනු ඇතුළුව, මුදල් පෙට්ටියේ දෛනික මුදල් ශේෂ තහවුරු වන පරිදි පවත්වාගෙන යාම.

06. ගබඩාව භාරව කටයුතු කිරිම, ගබඩාවට භාණ්ඩ ලබාගැනීම හා නිකුත් කිරිම, අදාල ලේඛන නඩත්තු කිරිම.

07. වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම හා ඊට අදාළ පාර්ශවයන් හා සම්බන්ධව දත්ත එක්රැස් කිරීම.

08. වැය ලෙජරය නඩත්තු කිරීම, වරින්වර අයවැය ලේඛනයේ ප්‍රතිපාදන හා සත්‍ය වියදම් සසඳා බලා ඉදිරි කාලය සඳහාප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම්, අදාළ පරිදි මුදල් රෙගුලාසි 66 පරිදි ප්‍රතිපාදන මාරුකර ගැනීම මෙන්ම අමතර ප්‍රතිපාදන මාරුකර ගැනීම හා අමතර ප්‍රතිපාදන ලබා ගැනිමට කටයුතු කිරිම.

09. පොදු තැන්පත් ගිණුම පවත්වාගෙන යාම සහ මාසික ගිණුම් වාර්තා සකස්කර නියමිත දිනට පෙර යැවීමට කටයුතු කිරිම.

10. භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පරීක්ෂා කිරීම, මාසික අග්‍රිම අයදුම්පත පිළියෙල කර නියමිත දිනට පෙර භාණ්ඩාගාරය වෙත යැවීම.

11. සියලුම මිළදී ගැනීමේ කටයුතු හා ඊට අදාළ ටෙන්ඩර් කැඳවීම, මිළදී ගන්නා ලද වට්ටෝරු භාණ්ඩ විෂයභාර නිළධාරි වෙත නිසි පරිදි භාරදීම හා සියලු මිළදි ගැනීම් වෙනුවෙන් වවුචර්පත් සැකසීම හා ඒවා ගෙවීම් කිරිමට ඉදිරිපත් කිරීම.

12. ගෙවීම් කිරිමේදී අය කරන ලද මුද්දර ගාස්තු හා රඳවුම් බදු නියමිත දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරිම.

13. මාසිකව බැංකු සැසඳුම් විස්තරය සකස් කිරිම.

14. බාහිර රාජ්‍ය ආයතන වෙත ප්‍රතිපාදන මාරුකිරිම හා ඊට අදාළ හර නිවේදන ගිණුම්ගත කිරිමේ කටයුතු සිදුකිරිම.

# ❖ අභ්‍යන්තර විගණන අංශය

දෙපාර්තමේන්තු වේ පාලන,සංවර්ධන හා ගිණුම් යන අංශ තුනෙහි කාර්යයන් නියමිත විධිවිධාන හා රෙගුලාසි යටතේ ඉටු කරනු ලබන්නේ ද යන්න පිළිබඳව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

එම කාර්ය පහත සඳහන් ආකාරයෙන් සිදුකරනු ලබයි.

1. අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම හා අනුමත කර ගැනීම.
2. අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
3. කාර්තුමය වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම.
4. විගණන විමසුම් නිකුත් කිරීම
5. කළමණාකරණ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම
6. විගණන විමසුම් හා ගිණුම් කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම හා විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීම

## 1.4. සංවිධාන සටහන

### ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාතර්මේන්තුව



# පරිච්ඡේදය - 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව 2019

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින මිලියන දෙකක ට අධික කිතුණු ජනතාවගේ සුභසාධන කටයුතු සඳහා ක්‍රියාත්මක වන 45ක පමණ කාර්ය මණ්ඩලයකින් යුතු දෙපාර්තමේන්තුවකි.

කිතුණු ජාතික සිද්ධස්ථාන, දේවස්ථාන හා ආගමික ස්ථාන සංවර්ධනය, නත්තල් , පාස්කු වැනි ආගමික හා ජාතික උත්සව සඳහා දායකත්වය සැපයීම, අධ්‍යාත්මික හා කිතුණු ආගමික වැඩසටහන් සවිධානය, කිතුණු කලා ශිල්ප සුරැකීම හා ප්‍රවර්ධනය මෙම දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

මෙම දෙපාර්තමේන්තුව වාර්ෂික ව ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කරන අතර, 2019.04.21 වන පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කරන ලද වැඩසටහන් රාශියක් අවලංගු කිරීමට හා කල් දැමීමට සිදු වුව ද කිතුණු ප්‍රජාව එමගින් අගතියට පත් වීමට ඉඩ නොදී විවිධ විකල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

කේන්ද්‍රගත ව පැවැත්වීමට නියමිත ව තිබූ තරඟාවලි විමධ්‍යගත ව පැවැත්වීම, දෙපාර්තමේන්තු නිලධාරීන් විවිධ ප්‍රදේශ වල ට යවා වැඩසටහන් සිදුකරවීම තුලින් රජයේ වියදම් ද අඩු කර ගනිමින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව සමත් විය.

වර්ෂ අවසානයේ දී නියමිත පරිදි භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම භෞතික වශයෙන් දෙපාර්තමේන්තුව අත්පත් කරගත් කාර්ය සාධන මට්ටම වෙත මූල්‍ය වශයෙන් ළඟා කර නොගැනීමට හේතු පාදක විය.

මාණ්ඩලික නිලධාරීන් ද ඇතුළුව දෙපාර්තමේන්තු ව තුල පවත්නා තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම අභියෝගයක් ව පවතී. තව ද දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට මේ දක්වා ම කුලී ගොඩනැගිලි වල පවත්වාගෙන යනු ලබන අතර, රජයේ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට නොයෙක් වර අයදුම් කල ද එය මෙතෙක් සාර්ථක වී නොමැත.

දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව වාර්ෂික ව අනුමත වන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර, එම ප්‍රතිපාදන ප්‍රමාණය ඉහල නැංවෙන්නේනම් කිතුණු ජනතාව වෙත වඩාත් ප්‍රශස්ථ සේවාව ක් ලබා දීමට දෙපාර්තමේන්තුවට හැකි වනු ඇත.

එම්.චතුරි පින්තු

අධ්‍යක්ෂ

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

# 02.01 ප්‍රගතිය හා ඉදිරි දැක්ම
# 2019 වර්ෂයේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන්
### ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | වැඩසටහන /ව්‍යාපෘතිය | 2019 අයවැය ප්‍රතිපාදන (රු.මි) | ප්‍රගතිය | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය % | මූල්‍ය ප්‍රගතිය % | |
| 01 | අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම | 2 | 80% | 20% | අක් මුදල් නොලැබීම නිසා සහ 04/21 වන දින පාස්කු ප්‍රහාරය නිසා වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. |
| 02 | අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු | 1.53 | 100% | 100% | |
| 03 | පාස්කු අතිරේකය හා පාස්කු වැඩසටහන | 2.3 | 100% | 100% | |
| | නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරඟය | 7 | 100% | 100% | |
| 04 | දීප ව්‍යාප්ත කැරොල් තරඟාවලිය | | 80% | 80% | |
| | නත්තල් සුභ පැතුම් පත මුද්‍රණය කිරීම | | 100% | 80% | |
| | විවිධ ආයතනයන්හි සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා ප්‍රදානයන් | | 80% | 40% | ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම හේතුවෙන් බහුතර වැඩසටහන් ප්‍රමාණයක් සඳහා ප්‍රදානයන් සිදු කිරීමට නොහැකි විය. |
| | රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම | | | | |
| | ආර්ථික වශයෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන දේවස්ථාන / ආයතන වල ප්‍රතිසංස්කරණ සඳහා දායකත්වය ලබා දීම සහ විශේෂිත දේවස්ථාන වල මංගල්‍යය වල දී වන්දනාකරුවන්ට පහසුකම් සැලසීම | 7.3 | 100% | 100% | |
| 05 | ධර්මප්‍රභාෂ්වර උත්තමාචාර උළෙල | 40 | 100% | 77% | අක් මුදල් නොලැබීම |
| 06 | නාට්‍ය වැඩමුලු හා තරඟ පැවැත්වීම | | 100% | 77% | අක් මුදල් නොලැබීම |
| 07 | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම. | 26 | 20% | 65% | අක් මුදල් නොලැබීම හේතුවෙන් |
| 08 | වන්දනා ගමන් ආඥා පතන යටතෙ ප්‍රකාශිත දේවස්ථාන වල වාර්ෂික මංගල්‍යයන් පැවැත්වීම | 12 | 100% | 88% | අක් මුදල් නොලැබීම නිසා දේවස්ථාන 02 ක් සඳහා මුදල් ලබා දීමට නොහැකි විය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බයිබල් දැනුම මිනුම තරඟාවලිය - 2019 | 6 | 100% | 90% | පාස්කු ප්‍රහාරය නිසා කොළඹ පදවිය සහභාගි නොවීම.<br><br>පදවි මට්ටමින් ද ප්‍රස්කු ප්‍රහාරය නිසා දරුවන්ගේ සහභාගිත්වය අඩු වීම. |
| | දහම් අධ්‍යාපනය - 2019 | | 100% | 90% | |
| | දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල පොත් දීමනාව ලබා දීම | 75.5 | 100% | 99% | අක් මුදල් නොලැබීම හේතුවෙන් |
| | දහම් පාසැල් වල සංවර්ධන කටයුතු සහ විවිධ ආයතන වල සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දීම | 10.6 | 100% | 98.27% | ඉතිරිය 184,565.20<br><br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 අනුව 10% ප්‍රතිපාදන අවුරා තබන ලෙස මුදල් අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලැබී ඇත. |
| | දේවස්ථාන වල ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ හා දේවස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධ කාර්යයන් සඳහා දායකත්වය ලබා දීම | 23.5 | 100% | 96% | ඉතිරිය රු.246,155/41<br><br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 අනුව 10% ප්‍රතිපාදන අවුරා තබන ලෙස මුදල් අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලැබී ඇත. |
| | වන්දනා ගමන් ආඥා පතන යටතෙ ප්‍රකාශිත සිද්ධස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය | 14.48 | 100% | 43% | මිලියන 14.48 ක් ලෙස අයවැය යෝජනා අනුමත ප්‍රතිපාදන 2019/07/08 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් යොමු කල ලිපියට අනුව රු.මිලියන 7.7 ක් අවුරා තැබීමට කටයුතු කරන ලදී. |
| | මඩු සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය | 199.5 | 100% | 37.9% | අක් මුදල් නොලැබීම හේතුවෙන් |

# පරිච්ඡේදය - 03

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන  සමස්ත මුල්‍ය කාර්ය සාධනය

# 3. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2019 | | සටහන | සත්‍ය 2019 | සත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 185,212,435 | 198,609,930.00 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 1,444,482 | 263,222.00 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 1,534,495 | 1,860,720.00 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 1,755,739 | 1,216,055.00 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **189,947,151** | 201,949,927.00 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **189,947,151** | 201,949,927.00 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 23,000,000.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 22,710,067 | 20,373,622.00 | ඒසීඒ-2(ii) |
| 14,958,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 9,583,430 | 9,342,524.00 | ඒසීඒ-2(ii) |
| 146,002,000.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 125,138,029 | 137,383,436.00 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 14,590.00 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 14,590 | - | ඒසීඒ-2(ii) |
| 183,974,590.00 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **157,446,116** | 167,099,582.00 | |
| | **මූලධන වියදම්** | | | | |
| 800,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 277,191 | 103,773.00 | ඒසීඒ-2(ii) |
| 1,700,000.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 764,055 | 971,912.00 | ඒසීඒ-2(ii) |
| 10,650,000.00 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 10,464,585 | 6,999,260.00 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 750,000.00 | හැකියා වර්ධනය | 14 | 739,830 | 399,600.00 | ඒසීඒ-2(ii) |
| 37,985,000.00 | වෙනත් මූලධන වියදම් | 15 | 66,752,233 | 40,461,601.00 | ඒසීඒ-2(ii) |
| 51,885,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **78,997,894** | 48,936,146.00 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **3,418,410** | 2,510,529.00 | |
| | **තැන්පතු ගෙවීම්** | | 968,441 | 262,872.00 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 2,449,969 | 2,247,657.00 | ඒසීඒ-5 |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 239,862,420 | 218,546,257.00 | |
| - | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | (49,915,269) | (16,596,330.00) | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2019 දෙසැම්බර් 31 දිනට**
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය 2019 රු. | සත්‍ය 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 26,890,353 | 26,259,763 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 6,208,076 | 5,292,602 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **33,098,429** | **31,552,365** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 5,727,710 | 5,288,277 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 26,890,353 | 26,259,763 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 480,366 | 4,325 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **33,098,429** | **31,552,365** |

පිටු අංක 01 සිට 50 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 51 සිට 63 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ගණකාධිකාරි |
| නම : | එම්. චතුරි පින්තු | එස්.කේ. කුසලකුමාරන් |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2020/02/ | දිනය : 26/02/2020 | දිනය : 25/02/2020 |

එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර
ලේකම්
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
08 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

එම්. චතුරි පින්තු
අධ්‍යක්ෂ (රා.ඉ.)
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
16/1, ෂේඩිග්‍රෝව් ඇවනිව්,
කොටා පාර, කොළඹ 08.

S.K. Kusalakumaran
Accountant
Department of Christian Religious Affairs

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජීසීජ්-සි

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| මුළු බදු ලැබීම | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 1,755,739 | 199.825.985 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම | | 185,212,435 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **186,968,174** | **199,825,985** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 32,148,477 | 150,175,175 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 120,564,710 | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 394,667 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 473 | 910 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **153,108,327** | **150,176,085** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **33,859,847** | **49,649,900** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 1,299,585 | 1,117,830 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **1,299,585** | **1,117,830** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | | 33,373,641 | 50,768.080 |
| අත්තිකාරම් ගෙවීම් | | 2,261,832 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **35,635,473** | **50,768,080** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(34,335,888)** | **(49,650,250)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **(476,041)** | **(350)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| තැන්පතු ලැබීම් | | 1,444.482 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **1,444,482** | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| තැන්පතු ගෙවීම් | | 968,441 | 350 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **968,441** | **350** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **476,041** | **(350)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | | **-** | **350** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **-** | **-** |

## 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය : 203

රු.

| අග්‍රිම ගිණුම් අංකය | 2019 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1 | | | අග්‍රිම ලැබීම් 2 | | | අග්‍රිම පියවීම 3 | | | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4 | | | 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නොපිය වූ උප අග්‍රිම 1(i) | නොපිය වූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර) 1(ii) | එකතුව 1(iii) | භාණ්ඩාගාරයෙන් 2(i) | වෙනත් මූලාශ්‍රවලින් 2(ii) | එකතුව 2(iii) | වියදම් මගින් 3(i) | මුදල් මගින් 3(ii) | එකතුව 3(iii) | නොපිය වූ උප අග්‍රිම ශේෂය 4(i) | නොපිය වූ අග්‍රිම ශේෂය 4(ii) | එකතුව 4(iii) | 5 |
| 7002/0000/00/0404/0017/000 | - | - | - | 185,212,435 | 1,826,512 | 187,038,947 | 187,038,474 | 473 | 187,038,947 | - | - | - | 473 |

1. ඉහත 4 හා 5 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න
   (1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2019.12.31 දිනට මුදල් ශේෂය — රු. 473
   (2) වෙනත් හේතු - ..................................................... ...........................

   රු. 473

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....................................
එස්.කේ. කුසලකුමාරන්
ගණකාධිකාරී
දිනය : 2020.02. 25

S.K. Kusalakumaran
Accountant
Department of Christian Religious Affairs

ඒසීඒ- 5

## 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම

වියදම් ශීර්ෂ අංකය : 203

දෙපාර්තමේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

රු.

| අත්තිකාරම් ගිණුමේ නම | අත්තිකාරම් ගිණුම් අංකය | අත්තිකාරම් ගිණුම් සංඛ්‍යාව | 2019 ජනවාරි 01 දිනට ශේෂය | වියදමෙහි උපරිම සීමා රු. 3,000,000 | | ලැබීම්වල අවම සීමා රු. 800,000 | | හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 12,000,000 | බැරකම් පිළිබඳ උපරිම සීමා රු. (නොමැත) | 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වර්ෂය තුළ හර කිරීම් | | වර්ෂය තුළ බැර කිරීම් | | ශේෂය | | |
| | | | (1) | (2) | | (3) | | 4=(1)+(2)-(3) | | |
| | | | | මුදලින් | හරස් සටහන් මගින් | මුදලින් | හරස් සටහන් මගින් | | | |
| (1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 8493/0/0/02/03/0011 | 1 | 5,292,602 | 2,261,832 | - | 1,299,585 | - | 6,254,849 | - | 6,254,849 |
| | 8493/0/0/02/03/0012 | | - | - | 188,137 | - | 234,910 | (46,773) | - | (46,773) |
| (2) අනෙකුත් අත්තිකාරම් | | | - | - | - | - | - | - | - | - |
| (3) විවිධ අත්තිකාරම් | | | - | - | - | - | - | - | - | - |
| එකතුව | | | 5,292,602 | 2,261,832 | 188,137 | 1,299,585 | 234,910 | 6,208,076 | - | 6,208,076 |

එස්.කේ. කුසලකුමාරන්
ගණකාධිකාරී
දිනය : 2020.02. 25

S.K. Kusalakumaran
Accountant
Department of Christian Religious Affairs

ඒසීඒ-2(□□

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 203 දෙපාතර්මේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාතර්මේන්තුව

රු.

| වැය විෂයය | ප්‍රතිපාදනය | | | | | | වියදම | | | ශුද්ධ බලපෑම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූල්‍යකරණ සංකේත අංකය | වාෂර්ක අයවැයගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+ | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුදල් පොතට අනුව වියදම (5) | මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාතර්මේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | මුළු වියදම (7)= (5)+(6) | ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7) | ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)□100 | වෙනස්කම්වලට හේතු |
| පුනරාවර්තන වියදම්<br>වැඩසටහන (1)<br>වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය<br>සටහන - 5 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ<br>පුද්ගල පඩිනඩි | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | 11 | 16,800,000 | - | (600,000) | 16,200,000 | 16,186,748 | - | 16,186,748 | 13,252 | 0 | සාමාන්‍ය ඉතිරියකි |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 11 | 1,200,000 | - | - | 1,200,000 | 1,008,416 | - | 1,008,416 | 191,584 | 16 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019අනුව වියදම් පාලනය හා ආරක්ෂක තත්වය හේතුවෙන් රාජකාරි අවලංගු වීම |
| 1003 වෙනත් දීමනා | 11 | 5,000,000 | - | 600,000 | 5,600,000 | 5,369,883 | 145,020 | 5,514,903 | 85,097 | 2 | සාමාන්‍ය ඉතිරියකි |
| එකතුව | | 23,000,000 | - | - | 23,000,000 | 22,565,047 | 145,020 | 22,710,067 | 289,933 | | |
| සටහන - 6 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා<br>ගමන් වියදම් | | | | | | | | | | | |
| 1101 දේශීය | 11 | 850,000 | - | 350,000 | 1,200,000 | 1,041,623 | - | 1,041,623 | 158,377 | 13 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019අනුව වියදම් පාලනය හා ආරක්ෂක තත්වය හේතුවෙන් රාජකාරි අවලංගු වීම |
| 1102 විදේශීය | 11 | 350,000 | - | (350,000) | - | - | - | - | - | | |
| එකතුව (අ) | | 1,200,000 | - | - | 1,200,000 | 1,041,623 | - | 1,041,623 | 158,377 | | |
| සැපයීම් | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 11 | 650,000 | - | 350,000 | 1,000,000 | 692,416 | - | 692,416 | 307,584 | 31 | අක්මුදල් නොලැබීම |
| 1202 ඉන්ධන | 11 | 1,250,000 | - | - | 1,250,000 | 664,310 | - | 664,310 | 585,690 | 47 | ආරක්ෂක තත්වය හේතුවෙන් රාජ්‍ය උත්සව අවලංගු වීම හා අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 අනුව වියදම් පාලනය |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 11 | 12,000 | - | (8,000) | 4,000 | 4,000 | - | 4,000 | - | - | |
| 1205 වෙනත් | 11 | 500,000 | - | 90,000 | 590,000 | 548,023 | - | 548,023 | 41,977 | 7 | අක්මුදල් නොලැබීම |
| එකතුව (ආ) | | 2,412,000 | - | 432,000 | 2,844,000 | 1,908,749 | - | 1,908,749 | 935,251 | 33 | |
| නඩත්තු වියදම් | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1301 වාහන | 11 | 1,500,000 | - | - | 1,500,000 | 614,999 | - | 614,999 | 885,001 | 59 | අක්මුදල් නොලැබීම හා නියමිත පරිදි සේවා කිරීම හේතුවෙන් නඩත්තු වියදම් අවම වීම |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 11 | 350,000 | - | - | 350,000 | 324,596 | - | 324,596 | 25,404 | 7 | අක්මුදල් නොලැබීම |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11 | 60,000 | - | (32,000) | 28,000 | 3,040 | - | 3,040 | 24,960 | 89 | සුලු අලුත්වැඩියා අවම වීම |
| එකතුව ( ඇ ) | | 1,910,000 | - | (32,000) | 1,878,000 | 942,635 | - | 942,635 | 935,365 | 50 | |
| සේවා | | | | | | | | | | | |
| 1401 ප්‍රවාහන | 11 | 120,000 | - | - | 120,000 | 88,451 | - | 88,451 | 31,549 | 26 | ආරක්ෂක තත්වය හේතුවෙන් රාජකාරි අවලංගු වීම |
| 1402 තැපැල් හා සන්නිවේදන | 11 | 600,000 | - | (50,000) | 550,000 | 366,180 | - | 366,180 | 183,820 | 33 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019අනුව වියදම් පාලනය, රාජකාරි අවලංගු වීම හා 2019වසරට අදාල තැපැල් වියදම් බිල් පත් නොලැබීම |
| 1403 විදුලිය හා ජලය | 11 | 400,000 | - | - | 400,000 | 292,157 | - | 292,157 | 107,843 | 27 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 අනුව වියදම් පාලනයට ලද උපදෙස් අනුව කටයුතු කිරීම |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 11 | 4,916,000 | - | (1,335,000) | 3,581,000 | 2,319,707 | - | 2,319,707 | 1,261,293 | 35 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 හා 07/2019 අනුව දෙපාතර්මේන්තු නව කුළී ගොඩනැගිලි අත්තිකාරම් හා අදාල වියදම් නියමිත කාලයට සිදු කිරීමට නොහැකි වීම |
| 1409 වෙනත් | 11 | 3,400,000 | - | - | 3,400,000 | 2,623,928 | - | 2,623,928 | 776,072 | 23 | අක්මුදල් නොලැබීම |
| එකතුව ( ඈ ) | | 9,436,000 | - | (1,385,000) | 8,051,000 | 5,690,423 | - | 5,690,423 | 2,360,577 | | |
| අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ) | | 14,958,000 | - | (985,000) | 13,973,000 | 9,583,430 | - | 9,583,430 | 4,389,570 | | |
| සටහන - 7 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රදානයන් සහ සහනාධාර<br><u>මාරුකිරීම්</u> | | | | | | | | | | | |
| 1501 සුභසාධන වැඩසටහන් | 11 | - | - | 970,410 | 970,410 | - | - | - | 970,410 | 100 | තොරතුරු ලබා දීමේදී සිදු වූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ගුරුවරුන්ගේ තොරතුරු සීඩී තැටියට ඇතුලත් නොවීම හේතුවෙන් 13-1501 වැය විෂයට ඉල්ලුම් කළ ප්‍රතිපාදන මාර්ග ගත ක්‍රමය අනුව මු.රේ.66 යටතේ මාරු කිරීමේදී සිදු වූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ඇති වූ වැය ශීර්ෂයකි. |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 11 | 450,000 | - | - | 450,000 | 315,976 | - | 315,976 | 134,024 | 30 | අපේක්ෂිත පරිදි දේපළ ණය ඉල්ලුම් නොකිරීම |
| 1508 වෙනත් | 11 | 22,052,000 | - | - | 22,052,000 | 9,992,725 | 3,780,054 | 13,772,779 | 8,279,221 | 38 | අක්මුදල් නොලැබීම ආරක්ෂක තත්වය හේතුවෙන් රාජ්‍ය උත්සව අවලංගු වීම |
| 2-1409 කිතුණු ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 11 | 4,000,000 | - | - | 4,000,000 | 3,008,690 | - | 3,008,690 | 991,310 | 25 | අක්මුදල් නොලැබීම |
| 3-1501දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම | 11 | 26,000,000 | - | - | 26,000,000 | 17,004,671 | - | 17,004,671 | 8,995,329 | 35 | අක්මුදල් නොලැබීම හා සැපයුම්කරුවෙකු නිල ඇඳුම් භාර දීම ප්‍රමාද වීම. |
| 4-1508 වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් | 11 | 12,000,000 | - | - | 12,000,000 | 9,764,800 | 797,855 | 10,562,655 | 1,437,345 | 12 | අක්මුදල් නොලැබීම |
| 5-1508 ආගමික අධ්‍යාපනය හා දහම්පාසල් ක්‍රියාකාරකම් | 11 | 6,000,000 | - | - | 6,000,000 | 5,388,258 | 10,000 | 5,398,258 | 601,742 | 10 | ආරක්ෂක තත්වය හේතුවෙන් දහම්පාසල් වැඩසටහන් අවලංගු වීම හා අක්මුදල් නොලැබීම |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 13-1501 දැහැමි දිරිය හා දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල පොත් දීමනාව | 11 | 75,500,000 | - | - | 75,500,000 | 75,075,000 | - | 75,075,000 | 425,000 | 1 | අක්මුදල් නොලැබීම |
| එකතුව | | 146,002,000 | - | 970,410 | 146,972,410 | 120,550,120 | 4,587,909 | 125,138,029 | 21,834,381 | 15 | |
| සටහන - 9 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් 1701 පාඩු සහ කපාහැරීම් | 11 | - | - | 14,590 | 14,590 | 14,590 | - | 14,590 | - | - | ඉතිරියක් නොමැත |
| එකතුව | | - | - | 14,590 | 14,590 | 14,590 | - | 14,590 | - | - | |
| වැඩසටහන (1) | | | | | | | | | | | |
| මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9) | 11 | 183,960,000 | - | - | 183,960,000 | 152,713,187 | 4,732,929 | 157,446,116 | 26,513,884 | 14 | |
| මූලධන වියදම් වැඩසටහන (1) වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය සටහන - 10 මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | | | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 11 | 200,000 | - | - | 200,000 | - | - | - | 200,000 | 100 | විශාල අලුත්වැඩියා කටයුතු නොවීම |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 100,000 | - | - | 100,000 | 73,691 | - | 73,691 | 26,309 | 26 | විශාල අලුත්වැඩියා කටයුතු නොවීම |
| 2003 වාහන | 11 | 500,000 | - | - | 500,000 | 203,500 | - | 203,500 | 296,500 | 59 | විශාල අලුත්වැඩියා කටයුතු නොවීම |
| එකතුව (අ) | | 800,000 | - | - | 800,000 | 277,191 | - | 277,191 | 522,809 | 65 | |
| සටහන - 11 මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 11 | 1,500,000 | - | - | 1,500,000 | 717,700 | - | 717,700 | 782,300 | 52 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 හා 07/2019 අනුව වියදම් පාලනය |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 11 | 200,000 | - | - | 200,000 | 46,355 | - | 46,355 | 153,645 | 77 | අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 හා 07/2019 අනුව වියදම් පාලනය |
| එකතුව (ආ) | | 1,700,000 | - | - | 1,700,000 | 764,055 | - | 764,055 | 935,945 | 55 | |
| සටහන -12 ප්‍රාග්ධන මාරුකිරීම් | | | | | | | | | | | |
| 2205 රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් | 11 | 10,650,000 | - | - | 10,650,000 | 10,464,585 | - | 10,464,585 | 185,415 | 2 | සාමාන්‍ය ඉතිරියකි |
| එකතුව ( ඇ ) | | 10,650,000 | - | - | 10,650,000 | 10,464,585 | - | 10,464,585 | 185,415 | 2 | |
| සටහන - 14 හැකියා වර්ධනය | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 11 | 750,000 | - | - | 750,000 | 739,830 | - | 739,830 | 10,170 | 1 | සාමාන්‍ය ඉතිරියකි |
| **එකතුව (ඉ )** | | 750,000 | - | - | 750,000 | 739,830 | - | 739,830 | 10,170 | 1 | |

ඊසීඊ-2(ii)

## 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 203

දෙපාර්තමේන්තුවේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

රු.

| වැය විෂයය | මූල්‍යකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1) | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+ | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම: මුදල් පොතට අනුව වියදම (5) | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6) | වියදම: මුළු වියදම (7)= (5)+(6) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100 | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සටහන - 14 හැකියා වර්ධනය | | | | | | | | | | | |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 11 | 750,000 | - | - | 750,000 | 739,830 | - | 739,830 | 10,170 | 1 | සාමාන්‍ය ඉතිරියකි |
| එකතුව (ඉ ) | | 750,000 | - | - | 750,000 | 739,830 | - | 739,830 | 10,170 | 1 | |
| සටහන - 15 වෙනත් මූලධන වියදම් | | | | | | | | | | | |
| 10-2205 රාජ්‍ය නොවන ආයතන වෙත මූල්‍ය ප්‍රදානය | 11 | 23,505,000 | - | - | 23,505,000 | 20,995,480 | 1,595,707 | 22,591,187 | 913,813 | 4 | සාමාන්‍ය ඉතිරියකි |
| 11-2205 රාජ්‍ය නොවන ආයතන වෙත මූල්‍ය ප්‍රදානය - තලවිල ශා. ආනා මුනිතුමියගේ සිද්ධස්ථානයට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | 11 | 14,480,000 | - | - | 14,480,000 | 132,500 | 6,145,915 | 6,278,415 | 8,201,585 | 57 | ජාතික අයවැය දෙපාර්තමේන්තු උපදෙස්, අයවැය චක්‍ර ලේඛ අංක 05/2019 හා 07/2019 අනුව වියදම් පාලනය |
| 15-2205 රාජ්‍ය නොවන ආයතන වෙත මූල්‍ය ප්‍රදානය - මඩු සිද්ධස්ථානය | 11 | - | 199,500,000 | - | 199,500,000 | - | 37,882,631 | 37,882,631 | 161,617,369 | 81 | මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම |
| එකතුව (ඊ) | | 37,985,000 | 199,500,000 | - | 237,485,000 | 21,127,980 | 45,624,253 | 66,752,233 | 170,732,767 | | |
| වැඩසටහන (1) රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඉ+ඊ) | | 51,885,000 | 199,500,000 | - | 251,385,000 | 33,373,641 | 45,624,253 | 78,997,894 | 172,387,106 | | |
| මුළු වියදම්වල එකතුව (සටහන 5-15) | | 235,845,000 | 199,500,000 | - | 435,345,000 | 186,086,828 | 50,357,182 | 236,444,010 | 198,900,990 | | |

එස්.කේ. කුසලකුමාරන්
ගණකාධිකාරී
දිනය :2020.02. 25

S.K. Kusalakumaran
Accountant
Department of Christian Religious Affairs

## 3.4. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසානය | | |
| පුනරාවර්තන | 183,960.000 | 183,960.000 | 157,446,116 | 85% |
| ප්‍රග්ධන | 51,885,000 | 251,385.000 | 78,997,894 | 31% |

## 3.5. මූ.රෙ. 208 ප්‍රකාරව , වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාතර්මේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1. | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය. | උපාධිධාරි දීමනාව ලබාදීම. | 460,000.00 | | 394,666.66 | 85.8% |

## 3.6. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. .000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්තව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 1,398,800.00 | 1,398,800.00 | — | — |
| 9152 | යන්ත්‍රෝපකරණ | 25,491,553.00 | 25,491,553.00 | — | — |
| 9153 | ඉඩම | — | — | — | — |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | — | — | — | — |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම | — | — | — | — |
| 9160 | කෙරීගෙන යන වැඩ | — | — | — | — |
| 9180 | බදු දෙන ලද වත්කම | — | — | — | — |

## 3.10 විගණකාධිපතිගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඒඑස්/ඩී/ඩීසීආර්/2/2019/15  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2020 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී,

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

**ශීර්ෂය- 203 ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL



## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයයන් 14 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදනයම සලසා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ප්‍රතිපාදනයෙන් රු.193,841,404 ක් හෙවත් සියයට 23 සිට සියයට 100 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

### 2.2 අත්තිකාරම් ගිණුම්

2018 මාර්තු මාසයේදී සේවයහැර ගිය නිලධාරියෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.100,558 ක් අයවීමට පැවති අතර 2020 මැයි 20 දින වන විටත් එම ශේෂයෙන් රු. 80,558ක් අයකර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එච්. ජී. සරත්,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

# පරිච්ඡේදය 04 කාර්ය සාධක දර්ශක

## ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| මූලික වගකීම | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුවසැලසුම් කර ඇති ප්‍රදාන කාර්යයන් | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන පරිදි ප්‍රමුඛ කාර්යය සාධක දශර්ක | ඇස්තමේන්තුගත වාර්ෂික පිරිවැය (රු.මිලි. අදාල නම් පමණි) | ප්‍රගතිය | | බැහැරවීමක් ඇත්නම් එයට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | | භෞතික % (ප්‍රමාණාත්මක) % | මූල්‍ය % | |
| **පුනරාවතර්න වියදම්** | | | | | | |
| 203-02-01-0-1508 | අධ්‍යාත්මික පෞරුෂත්ව සංවධර්න වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම | වැඩසටහන් 25 ක් සඳහා දායකත්වය ලබා දීම | 2 | 80% | 20% | අක් මුදල් නොලැබීම නිසා සහ 04/21 වන දින පාස්කු ප්‍රහාරය නිසා වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. |
| 203-02-01-0-1508 | අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු | වැඩසටහන් 03 ක් සඳහා දායකත්වය ලබා දීම | 1.53 | 100% | 100% | |
| 203-02-01-0-150 | පාස්කු අතිරේකය හා<br><br>පාස්කු වැඩසටහන් | සියළුම ලාංකික පාඨකයින් (සියළුම පාඨකයින් වෙනුවෙන් කිතුණු ලේඛක ලේඛිකාවන්ගේ හා කිතුණු ජනතාවගේ නිර්මාණ .) පාස්කු වැඩසටහන් 29ක් සඳහා ප්‍රදානයන් ලබා දීම. | 0.6 | 100% | 100% | |
| | නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරඟය | සියළුම ශ්‍රී ලාංකිකයන් සඳහා(චිත්‍ර 1000කට ආසන්න ප්‍රමාණයක් තරඟයට ඉදිරිපත් වීම) | | 100% | 100% | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 203-02-01-0-1508 | දීප ව්‍යාප්ත කැරොල් තරඟාවලිය | කණ්ඩායම් 31 මාධ්‍ය තුනෙන්ම සහභාගීවීම | 7 | 80% | 80% | |
| | නත්තල් සුභ පැතුම් පත මුද්‍රණය කිරීම | දෙපාර්තමේන්තුව සමඟ රාජකාරී කටයුතු සිදුකරන රාජ්‍ය ආයතන නිළධාරීන් හා සියළුම කතෝලික ප්‍රජාව | | 100% | 80% | |
| | විවිධ ආයතනයන්හි සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා ප්‍රදානයන් | නත්තල් වැඩසටහන් 33ක් සඳහා | | 80% | 40% | ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම හේතුවෙන් බහුතර වැඩසටහන් ප්‍රමාණයක් සඳහා ප්‍රදානයන් සිදු කිරීමට නොහැකි විය. |
| | රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම | පාස්කු ප්‍රහාරය හේතුවෙන් රදගුරු මණ්ඩලයේ ඉල්ලීමකට අනුව රාජ්‍ය නත්තල් උත්සවය නොපවත්වන ලදී.එයට සමගාමීව ගාල්ල පදවියේ දහම් පාසැල් (කතෝලික)පුස්ත කාල සඳහා පොත් හා පුස්තකාල උපකරණ ලබා දෙන ලදී.(එම වසරේදී රාජ්‍ය නත්තල් උත්සවය පැවැත්වීමට සංවිධානය කරන ලද්දේ ගාල්ල පදවිය තුලය) | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ආර්ථික වශයෙන් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන දේවස්ථාන / ආයතන වල ප්‍රතිසංස්කරණ සඳහා දායකත්වය ලබා දීම සහ විශේෂිත දේවස්ථාන වල මංගල්‍යය වල දී වන්දනාකරුවන්ට පහසුකම් සැලසීම | මූල්‍ය ආධාර ලබන දේවස්ථාන / ආයතන සංඛ්‍යාව (203-02-01-1508 වැය විෂයේ එක් කොටසකි) | | 100% | 100% | |
| 203-02-01-0-1508 | ධමර්ප්‍රභාෂ්වර උත්තමාචාර උළෙල | සම්මාන 47 ක ලබා දීම | | 100% | 77% | අක් මුදල් නොලැබීම |
| 203-02-01-02-1409 | නාට්‍ය වැඩමුලු හා තරඟ පැවෙත්වීම | නාට්‍ය වැඩමුලු 08ක් පැවැත්වීම සිංහල හා දෙමළ මාධ්‍ය නාට්‍ය තරගාවලිය පලමු, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් කණ්ඩායම් 6ක් සඳහා කුසලතා හා මුදල් ත්‍යාග ලබා දීම. තෝරාගත් කුසලතා දැක්වු 20 දෙනෙකුට මුදල් ත්‍යාග හා එයින් 10 දෙනෙකුට කුසලතා සහතික ලබා දීම | 40 | 100% | 77% | අක් මුදල් නොලැබීම |
| 203-02-01-03-1501 | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබා දීම. | ගුරුවරුන් 15093 ක් සඳහා | 26 | 20% | 65% | අක් මුදල් නොලැබීම හේතුවෙන් |
| 203-02-01-04-1508 | වන්දනා ගමන් ආඥා පතන යටතෙ ප්‍රකාශිත දේවස්ථාන වල වාර්ෂික මංගල්‍යයන් පැවැත්වීම | සිද්ධස්ථාන 14 ක් සඳහා ආධාර ලබා දීම. | 12 | 100% | 88% | අක් මුදල් නොලැබීම නිසා දේවස්ථාන 02 ක් සඳහා මුදල් ලබා දීමට නොහැකි විය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5-1508 | බයිබල් දැනුම මිනුම තරඟාවලිය - 2019 | ශ්‍රී ලංකාවේ සියළුම කතෝලික දරුවන් සඳහා බයිබල් දැනුම මිනුම තරගාවලිය පැවැත්වීම. ඒ තුළින් දරුවන්ගේ බයිබලීය දැනුම වර්ධනය වන අතර විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී ලකුණු ද හිමි වේ. | | 100% | - 90% | පාස්කු ප්‍රහාරය නිසා කොළඹ පදවිය සහභාගි නොවීම. පදවි මට්ටමින් ද ප්‍රස්කු ප්‍රහාරය නිසා දරුවන්ගේ සහභාගිත්වය අඩු වීම. |
| 203 02 01 -05 - 1508 | දහම් අධ්‍යාපනය - 2019 | පදවි මට්ටමින් කතෝලික දරුවන් හටත් දහම් ගුරුවරුන් හටත් සම්මන්ත්‍රණ, වැඩසටහන් පදවි ධර්මෝපදේශ සහ සංවර්ධන නිලධාරීන් මඟින් පවැත්වීම. | 6 | 100% | 90% | |
| 203-02-01-13-1501 | දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල පොත් දීමනාව ලබා දිම | ගුරුවරුන් 15093 ක් සඳහා | 75.5 | 100% | 99% | අක් මුදල් නොලැබිම හේතුවෙන් |

| මූලධන වියදම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| සංවර්ධන සහායයන් - 2019 (වැය විෂය 203-02-01-0-2205 ) | දහම් පාසැල් වල සංවධර්න කටයුතු සහ විවිධ ආයතන වල සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දීම | මූල්‍ය ආධාර ලබන දේවස්ථාන / ආයතන සංඛ්‍යාව | 10.65 (අවුරන ලද රු. 850/=ක මුදල හැර ප්‍රතිපාදන 10,649,150/=) | 100% | 98.27% | ඉතිරිය 184,565.20<br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 අනුව 10% ප්‍රතිපාදන අවුරා තබන ලෙස මුදල් අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලැබී ඇත. |
| දේවස්ථාන ඉදිකිරීම්, පුනරුත්ථාපන සහ යටිතල පහසුකම් සංවර්ධනය - 2019 ( වැය විෂය 203-02-01-10-2205) | දේවස්ථාන වල ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ හා දේවස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධ කාර්යයන් සඳහා දායකත්වය ලබා දීම | මූල්‍ය ආධාර ලබන දේවස්ථාන / ආයතන සංඛ්‍යාව | 23.5 (අවුරන ලද රු. 667,657/50 ක මුදල හැර ප්‍රතිපාදන 22,837,342.50) | 100% | 96% | ඉතිරිය රු.246,155/41<br>ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 අනුව 10% ප්‍රතිපාදන අවුරා තබන ලෙස මුදල් අමාත්‍යාංශය වෙතින් උපදෙස් ලැබී ඇත. |
| 203-02-01-11-2205 | වන්දනා ගමන් ආඥා පතන යටතෙ ප්‍රකාශිත සිද්ධස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය | සිද්ධස්ථාන 05ක් සඳහා | 14.48 | 100% | 43% | මිලියන 14.48 ක් ලෙස අයවැය යෝජනා අනුමත ප්‍රතිපාදන 2019/07/08 දිනැති ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් යොමු කල ලිපියට අනුව රු.මිලියන 7.7 ක් අවුරා තැබීමට කටයුතු කරන ලදී. |
| 203-02-01-15-2205 | මඩු සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය | අභ්‍යන්තර මාගර් පද්ධතිය 6 KM කාපට් අතුරා සංවර්ධනය කිරීම. | මිලියන 199.5 | | 37.9% | අක් මුදල් නොලැබිම හේතුවෙන් |

# පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන

## අරමුණු SDG සපුරා ගැනීමේ කාර්ය සාධනය

### හඳුනා ගත්තා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය/ අරමුණ | | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය<br>0%-49%<br>50%-74%<br>75% - 100% |
|---|---|---|---|---|
| 1409 | කිතුනු දහම පිළිබඳ ප්‍රකාශන මිලදී ගැනීම හා දහම් පාසල් පුස්තකාල වැඩසටහන | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 2030වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවධර්නය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම. | 75%-100% |
| | ජනවන්දනාව, කිතුනු කලාශිල්ප හා සංස්කෘතික කටයුතු | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 2030වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම. | 75%-100% |

| | | | | |
|---|---|---|---|---|
| 1508 | මුල්‍යා අවශ්‍යතා වලදී පල්ලි සහ අනෙකුත් ආගමික සංවිධාන වලට සහායය වීම | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවධර්නය කර නව්‍යකරණය දිරි ගැන්වීම | 9.1 ආර්ථික සංවර්ධනය හා මානව යහපැවැත්ම වෙනුවෙන් සියලුදෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 75%-100% |
| | අධ්‍යාත්මික පෞරුෂත්ව සංවධර්න වැඩසටහන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම | නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. | හානිකර මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැලැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම | 50%-74% |
| | | | දුම්කොළ භාවිත පාලනය කිරීම සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ සැලැස්ම සියලුම රටවලට අදාල වන පරිදි ශක්තිමත් කිරීම හා ක්‍රියාවට නැංවීම | |
| | පාස්කු මංගල්‍යය වැඩසටහන් සංවිධානය කිරීම | සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම | සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම | 75%-100% |
| | ජාතික නත්තල් වැඩසටහන් සංවිධානය කිරීම | "ජේසු උපත" මඟින් ගෙනෙන ප්‍රේමයේ පණිවිඩය ජාතික උත්සවය හරහා සමාජානුයෝජනය කරලීම. | සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම | 50%-74% |
| | අනෙකුත් ජාතික හා ආගමික අවස්ථා සංවිධානය කිරීම හා විවිධ කටයුතු | සෑම කිතුණුවකගේම අධ්‍යාත්මික ජීවිතය ශක්තිමත් කරලීම | සාමකාමී සමාජයකට කිතුණුවන් මෙහෙයවීම | 75%-100% |
| 1508-02 | කිතුනු ආගමික සාහිත්‍ය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ලේඛණ,රංගනය,මඟින් පෞරුෂත්වය වර්ධනය කිරීම. | කිතුණු කලා රසාස්වාදන උසස් මට්ටමකට ගෙන ඒම හා ඒ සඳහා උනන්දුවක් දක්වන්නන් ඇගයීමකට ලක් කිරීම.අනාගතයට ප්‍රශස්ත කලාකරුවන් දයාද කිරීම. | 75%-100% |
| 1409-03 | දහම් පාසල් ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් ලබා දීම | පරිපූණර්, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 2030වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ | 75%-100% |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම | |
| 1501-04 | වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රකාශිත දේවස්ථානයන්ගේ මංගල්‍යයන් පැවැත්වීම | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | 75%-100% |
| 1508-05 | ආගමික අධ්‍යාපනය හා දහම් පාසල් ක්‍රියාකාරකම් | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 2030වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම | 75%-100% |
| 1508-13 | දහම් පාසල් ගුරුවරුන් සඳහා දැහැමි දිරිය දීමනාව | පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 2030වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබා සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රවණඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිමය වශයෙන් දායකවීම | 75%-100% |

| මූලධන වියදම් | | | | |
|---|---|---|---|---|
| 2205-10 | දේවස්ථානයන්හි ඉදිකිරීම්, පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | 75%-100% |
| 2205-11 | වන්දනා ගමන් ආඥා පණත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති සිද්ධස්ථානවලට පැමිණෙන වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | 50%-74% |
| 2205-15 | මඩු සිද්ධස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය | නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | ලෝකයේ ස්භාවික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | 50%-74% |

දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන බොහෝ කාර්යයන් ප්‍රමාණාත්මක ව මැනිය නොහැකි කායර්යන් වීම මත නිශ්චිත ව තිරසර සංවධර්න ඉලක්ක හඳුනා ගැනීම දුෂ්කර විය. එසේ වුව ද දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර අනුව හඳුනාගන්නා ලද තිරසර අරමුණු කරා බොහෝ දුරට ළඟා වීමට දෙපාතර්මේන්තුවට හැකිවිය. 2019.04.21 දින සිදුවූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් පදවි හා ජාතික මට්ටමෙන් සංවිධානය කොට තිබූ වැඩසටහන් බොහොමයක් අවලංගු කිරීමට හා කල් දැමීමට සිදුවීම තිරසර සංවර්ධන අරමුණු කර ළඟා වීමට බාධාවක් විය. එසේ වුව ද විවිධ විකල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් හැකිතාක්දුරට ඉලක්කගත කාර්ය සාධනය කරා ළඟා වීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Advanced Excel | 2 | 2019.02.13,20,27 | 30000 | | දේශීය | Advanced Excel කුසලතා සංවර්ධනය |
| තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය හා ඇගයීම | 2 | 2019.02.21,22 | 17000 | | දේශීය | තොරතුරු තාක්ෂණයට අදාල භාණ්ඩ ප්‍රසම්පාදනය හා ඇගයීම් කුසලතා සංවර්ධනය |
| කාර්යාල කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමටත් උසස්වීම් කාර්යක්ෂමතා විභාග සඳහා රාජ්‍ය සේවයේ ඔබ සඳහාම වෙන්වූ සම්මන්ත්‍රණ මාලාව | 2 | 2019.04.02,05 | 14400 | | දේශීය | කාර්යාල කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමටත් උසස්වීම් කාර්යක්ෂමතා විභාග සඳහා කුසලතා සංවර්ධනය |
| අභ්‍යන්තර විගණනය සහතික පත්‍ර පාඨමාලාව | 1 | 2019.06.04,11,18,25 | 13000 | | දේශීය | අභ්‍යන්තර විගණන කුසලතා වර්ධනය |
| ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | 3 | 2019.05.06,07 | 21000 | | දේශීය | ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ කුසලතා වර්ධනය |
| Three day workshop on Database management in MS access | 3 | 2019.06.12,19,26 | 45000 | | දේශීය | Database management in MS access කුසලතා සංවර්ධනය |
| ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලාව | 1 | 2019.06.29 සිට සිව් මසක් | 20000 | | දේශීය | ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව |
| රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය හා භාණ්ඩාගාරයේ ගණුදෙණු ගිණුම්ගත කිරීම. | 1 | 2019.07.04,05 | 8500 | | දේශීය | රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය හා භාණ්ඩාගාරයේ ගණුදෙණු ගිණුම්ගත කිරීමේ කුසලතා |
| නවක කළමනාකරණ සහකරවරුන්ගේ වෘත්තීය සංවධර්නය | 5 | 2019.07.18,19,25,26 | 50000 | | දේශීය | නවක කළමනාකරණ සහකරවරුන්ගේ වෘත්තීය සංවර්ධනය වීම |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විශේෂඥයින් බිහි කිරීමේ පුහුණුව. | 1 | 2019.07.18,19,25,26 | 13500 | | දේශීය | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය තුල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් විශේෂඥයින් වීම. |
| Web Development | | 2019.07.29,30,31 | 18000 | | දේශීය | Web Development පිළිබඳ හැකියා වර්ධනය |
| තොරතුරු තාක්ෂණ නොවන නිළධාරීන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා | 1 | 2019.08.20,21 | 13000 | | දේශීය | තොරතුරු තාක්ෂණ නොවන නිළධාරීන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා වර්ධනය |
| කාර්යාල ක්‍රම | 1 | 2019.08.22,23 | 6000 | | දේශීය | කායර්ාල ක්‍රම පිළබඳ දැනුම වර්ධනය |
| රියදුරන් සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම හා විනය | 1 | 2019.10.10,11 | 8500 | | දේශීය | රියදුරන් සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධමර් හා විනය වැඩි දියුණු කිරීම |

# පරිච්ඡේදය 06 මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යේෂ්ඨ | 03 | 01 | 02 |
| තෘතියික | 01 | 01 | 00 |
| ද්විතියික | 55 | 39 | 16 |
| ප්‍රාථමික | 07 | 05 | 02 |

## 6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය

දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ.සහකාර අධ්‍යක්ෂ, ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු 04න් සහකාර අධ්‍යක්ෂ තනතුර හැර අනෙක් තනතුරු තුනම පුරප්පාඩුව පැවති අතර, අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි සහකාර අධ්‍යක්ෂ විසින් ඉටු කරන ලද අතර, ගණකාධිකාරී තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු සේවයේ යොදවා ගන්නා ලදී. පරිපාලන නිලධාරී තනතුර 2019.08.29 දින සම්පූර්ණ විය. සංවර්ධන නිලධාරී තනතුරු 11ක් පුරප්පාඩු ව පවතින අතර, සංවර්ධන නිලධාරීන් නොමැති පලාත් වල වැඩසටහන්, තරඟ හා සංවර්ධන කටයුතු දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් යොදවා ආවරණය කර ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව පවත්නා මානව සම්පත අභිප්‍රේරණය කරමින් ඔවුන්ගේ ආයකත්වය උපරිම වශයෙන් දෙපාර්තමේන්තු කාර්ය සාධනය පවත්වා ගැනීමට උපයෝජනය කොටගෙන ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය ) | නිමැවුම්/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| දෙවන භාෂා දෙමල පංති පැවැත්වීම | 13 | ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා | 232650 | | දේශීය | දෙවන භාෂා දෙමල කුසලතා වඩර්නය |
| රියදුරන් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි | 1 | 2019.01.24,25 | 8500 | | දේශීය | රියදුරන් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි සංවර්ධනය වීම |
| කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය | 3 | 2019.01.28,29 | 25500 | | දේශීය | කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය සංවර්ධනය වීම |
| සරප්/මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම | 1 | 2019.01.21 | 5000 | | දේශීය | සරප්/මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම වර්ධනය වීම |
| Trainingprogram on computer hardware & PC maintenance | 1 | 2019.01.28,29 | 13000 | | දේශීය | computer hardware & PC maintenance development |
| පුද්ගලික ලිපිගොනු කළමනාකරණය | 1 | 2019.02.14,15 | 13000 | | දේශීය | පුද්ගලික ලිපිගොනු කළමනාකරණ කුසලතා සංවර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| හා විනය | | | | | | දියුණු කිරීම |
| ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුලුව | 32 | 2019.11.22,23,24 | 164280 | | දේශීය | දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය |

දෙපාර්තමේන්තුවේ සේවා ව ලබා ගන්නා පාර්ශවයන්ගෙන් 30%-40%ක ප්‍රමාණයක් දෙමළ ජාතිකයන් වන අතර, දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලයෙන් 95%ක් ම සිංහල නිලධාරීන් වේ. ඒ අනුව පාර්ශව දෙක අතර සන්නිවේදන කටයුතු සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා දෙමළ භාෂා පුහුණුව ලබා දීම අත්‍යවශ්‍ය බැවින් දෙමළ භාෂා පුහුණුව ලබා දීමට ප්‍රමුඛත්වය දී කටයුතු කර ඇත. එමගින් කාර්ය මණ්ඩලයේ සන්නිවේදන හැකියාව දියුණු වී ආයතනයේ කාර්ය සාධනය ඉහල නැංවීමට හේතුපාදක වී ඇත.

නිලධාරීන් ට දැනට තමන් විසින් ඉටු කරනු ලබන රාජකාරී විෂයයන් ට අදාල ව පුහුණුවීම් ලබා දීමට සැම විට ම අවස්ථාව සලසා දෙන අතර, විශේෂ පුහුණුවීම් අවශ්‍ය විෂයන් හි රාජකාරියෙහි නියුක්ත නිලධාරීන් ස්ථාන මාරුවීමේ දී රාජකාරි කටයුතු අඩාල නොවී පවත්වාගෙන යා හැකි වන පරිද්දෙන් අදාල විෂයන් සම්බන්ධව වෙනත් නිලධාරීන් ව ද පවත්නා ප්‍රතිපාදන සීමාවන් යටතේ පුහුණුවීම් ලබා දීමට අවස්ථාව සලසා දී ඇත.

දෙපාර්තමේන්තු වැඩසටහන් වල දී කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බැවින් කණ්ඩායම් ලෙස කටයුතු කිරීම හා සේවක අභිප්‍රේරණය මූලික කොට ගනිමින් සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා ම වැඩමුළුවක් පවත්වන ලද අතර, එකී පුහුණුව සමස්ථ කාර්ය සාධනය ඉහල නැංවීමට ඉවහල් වී ඇත.

# පරිච්ඡේදය 07 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1. | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූලවේ | | |
| 1.2. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූලවේ | | |
| 1.3. | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4. | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.5. | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.6. | වෙනත් | අදාල නොවේ | | |
| 2. | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445) | | | |
| 2.1. | රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.2. | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.3. | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.4. | අභ්‍යන්තර විගණන වාතර්‍ා ලේඛනය යාවත්කාලීන කරපවත්වා ගෙනයාම | අනුකූලවේ | | |
| 2.5. | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 2.6. | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.7. | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.8. | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.9. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 3. | මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135) | | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.1. | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.2. | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූලවේ | | |
| 3.3. | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූලවේ | | |
| 3.4. | 2014.05.11 දිනැතිඅංක171/2004 දරණරාජ්‍යගිණුම්චක්‍ර ලේඛයඅනුව, රජයේපඩිපත්මෘදුකාංගපැකේජයභාවිතාකිරීමේදීගණකාධිකාරි වරයන්ගේපාලනයටයටත්වකටයුතුකිරීම | අනුකූලවේ | | |
| 4. | වාර්ෂික සැලසුම් සකස් කිරීම | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.2. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.3. | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 4.4. | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 4.5. | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 5. | විගණන විමසුම් | | | |
| 5.1. | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූලවේ | | |
| **6** | අභ්‍යන්තර විගණනය | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූලවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූලවේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| **7.** | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 4ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූලවේ | | |
| 8. | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කෝම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූලවේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූලවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූලවේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූලවේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | 109 යටතේ පොතෙන් කපා හැරීමට අමාත්‍යාංශය වෙත යවා ඇති අතර ඒ පිළිබඳව ප්‍රතිචාරයක් නොමැත. | | |
| 9.3 | වාහන ලෝග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූලවේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් වියි විධාන ප්‍රකාරව ,වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූලවේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූලවේ | KX-8144 රථය පවරා ගැනීමට R.M.V.යොමු කර ඇත. | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූලවේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බලකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූලවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාෂ වලින් අනාවරණය වූ හා ගැලපුම කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇරතුළත නිරවුල් කර තිබීම | | | |
| 17. | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවාගේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූලවේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉදිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට | අනුකූලවේ | | |
| 18. | **එලඹීම රජයේ නිලධාරින් ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල විම. | අනුකූලවේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබිම. | අනුකූලවේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුලු කර තිබිම. | අනුකූලවේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙමු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබිම. | අනුකූලවේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලින කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වෂර්ය අවසානයේ දි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාතර්මේන්තුවට ප්‍රේෂණය කර තිබිම. | අනුකූලවේ | | |
| 14.2 | මු.රේ.371 ප්‍රකාරව නිකුත් කල තත්කායර් අතුරු අග්‍රිම,එම කායර්ය අවසන් වි මාසයක් ඇතුළත නිරවුල් කර තිබිම | අනුකූලවේ | | |
| 14.3 | මු.රේ.371 ප්‍රකාරව අනුමත සිමාව ඉක්මවා නොයන පරිදි තත්කායර් අතුරු අග්‍රිම නිකුත් කර තිබිම | අනුකූලවේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරිම | අනුකූලවේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කල ආදායමෙන් ආපසු ගෙවිම් සිදු කොට තිබිම | අනුකූලවේ | | |
| 15.2 | රැස්කර තිබු ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබිම | අනුකූලවේ | | |
| 15.3 | මු.රේ.176 අනුව හිඟ  ආදායම් වාතර්ා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබිම | අදාල නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමණාකරණය** | | | |
| 16.1 | අනුමත කායර් මණ්ඩල සිමාව තුළ කායර් මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 16.2 | කායර් මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දි තිබිම | අනුකූලවේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSDචක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාතර්ා කළමණාකරණ සේවා දේපාතර්මේන්තුව වෙත ඉදිරිපත් කර තිබිම | අනුකූලවේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දිම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනිමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දිමේ ලේඛණයක් යාවත්කාලින කර පවත්වා ගෙන යාම | අනුකූලවේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාගර් හරහා ආයතනය පිළිබඳ මහජනයා ගේ ප්‍රශංසා /චෝදනා පළ කිරිමට පහසුකම් සළසා තිබිම | අනුකූලවේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනිමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාතර්ා ඉදිරිපත් කර තිබිම | අනුකූලවේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරිම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2008(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/සේවාලාභි ප්‍රඥාප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබිම | අනුකූලවේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභි ප්‍රඥාප්තිය සම්පාදනය කිරිම හා ක්‍රියාත්මක කිරිමේ කටයුතු අධික්ෂණය කිරිම හා ඇගයිම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබිම | අනුකූලවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **19** | **මානව සම්පත් සැළැස්ම සම්පාදනය කිරිම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැළැස්මක් සකස් කොට තිබිම | අනුකූලවේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැළැස්ම තුළ තහවුරු කොට තිබිම | අනුකූලවේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබිම | මීට අදාල පුහුණුව දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති අතර, හඳුන්වා දී ඇති ගිවිසුම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි බැවින් පුහුණුවක් අපේක්ෂා කරයි | | |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරිම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධන කිරිම, නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම පිළිබඳ වගකිම් පවරා ජොෂ්ඨ නිලධාරියකු පත් කොට තිබිම | අනුකූලවේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්විම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දි ඇති අඩු පාඩු නිවිරදි කොට තිබිම | අනුකූලවේ | | |